කාර්මීකරණයේ පාරිසරික බලපෑම

ඩබ්. ඒ. ඩබ්.එල්. වික්‍රමආරච්චි
තාවකාලික කථීකාචාර්ය
සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

සමාජය වූ කලී නිරන්තරයෙන් ම වෙනස්වීම්වලට භාජනය වන්නකි. මෙම වෙනස් වීම සමාජය තුළ ජීවත්වන මිනිසුන්ගේ ක්‍රියාකාරීත්වයන් තුළින් පැන නගිනු ලබන ප්‍රතිඵලයක් ලෙස විදහා දැක්විය හැකිය. පුද්ගලයන් එකිනෙකා එකතුව තුළින් සම්බන්ධ කරන අන්තර් සබඳතා ක්‍රමයක් ලෙස සමාජය හැඳින්විය හැකිය. (Giddens,1993,P32) නූතන සමාජය සංකීර්ණ වීමත් සමගම සමාජ වෙනස්වීම් රාශියක් සිදු වෙමින් පවතී. නූතන සංකීර්ණ සමාජයේ කාර්මීකරණයේ ප්‍රතිඵලයක් ලෙස පාරිසරික අර්බුද විශාල ප්‍රමාණයක් නිර්මාණය වී පැවතීම සැබෑවකි. මෙහි ආරම්භය පිළිබඳ දැක්වීමේ දී 18 වන, 19 වන සියවස්වල එංගලන්තයේ ඇති වූ කාර්මික ක්ෂේත්‍රයේ වෙනස්වීම් රාශියක් මේ සඳහා බලපෑ බව කිව යුතුය. විශාල අන්තර් සම්බන්ධතා ආර්ථික හා තාක්ෂණික සමාජ වෙනස්වීම 1760 සිට 1850 දක්වා කාලය තෙක් දිව යයි. එක්සත් රාජධානිය නව තාක්ෂණය හා කර්මාන්ත ක්‍රමයක් සහිත නිෂ්පාදන ආර්ථිකයක් මත පදනම් විය. මෙම වෙනස්වීම්වල ප්‍රතිඵලයක් වශයෙන් එක්සත් රාජධානිය ප්‍රථම කාර්මික සමාජය බවට පත්විය. (Collins Dictionary of Sociology,1991,P317) 19 වන සියවසට වඩා වේගයෙන් 20 වෙනි සියවස තුළ සමාජය වෙනස් වී ඇත. ජන විකාශ විද්‍යාත්මක වශයෙන් ද, ආර්ථික දේශපාලන සමාජීය සහ සංස්කෘතික වශයෙන් ද සමාජය බොහෝ අර්ථ විපර්යාසයන්ට භාජනය වී ඇත. නව යන්ත්‍ර සූත්‍ර බහුලව ව්‍යාප්ත වීම නිසා කාර්මීකරණයක් ද ජනමාධ්‍ය හා ප්‍රවාහන ක්‍රම දියුණු වීම නිසා ගම හා නගරය අතර සමීප බවක් ද පෙන්නුම් කරයි. ඒ නිසා නාගරීකරණ ක්‍රියාවලියක් ද දැකිය හැකිය. ඒ අනුව සමාජය වෙනස් වූ ආකාරය පෙන්වා දිය හැකිය. කාර්මික ක්ෂේත්‍රයේ ඇති වූ එක් වෙනස් වීමක් ලෙස මිනිස් ශ්‍රමය වෙනුවට මහාපරිමාණ වශයෙන් යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීම සිදුවූ නිසා මිනිසා ශතවර්ෂ ගණනාවක් තිස්සේ තම ශ්‍රමයෙන් දෑතේ සවියෙන් ඉටු කර ගත් අවශ්‍යතාවන් සියල්ල යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමට පටන් ගත් පසු කඩිනම් යාන්ත්‍රීකරණයට හසුවිය. මේ අනුව සමාජ වෙනස්වීම් පිළිබඳව සොයා බැලීමේදී කාර්මික විප්ලවය සිදු වූ යුගයට වැඩි අවධානයක් යොමුකළ යුතු වේ. එක් එක් සමාජවල මෙම යුගයේදී නව තාක්ෂණය හඳුන්වා දුන් අතර ක්ෂණිකව පාවිච්චි කළ හැකි දේ නිපදවීම තුළින් පසුගිය සියවස්වලට වඩා දැඩි ලෙස වෙනස්වීම් සිදුවිය. (Mair,1965, P235)

මෙසේ නිෂ්පාදන ක්‍රමය වෙනස් වන විට මෙතෙක් බල ශක්තිය ලෙස යොදාගත් ජලය සුළඟ වැනි ස්වාභාවික ශක්තීන් ද වෙනස් වීමකට ලක්විය. විශාල පරිමාණයෙන් භාණ්ඩ නිපදවීම සඳහා බල ශක්තියක් ලෙස 1697 හි දී වාෂ්ප බලය සොයාගන්නා ලදී. එය 1763 දී ජේම්ස් වොට් විසින් දියුණු කරන ලදී. 1831 දී මයිකල් පැරඩේ විසින් විදුලි බලය සොයා ගැනීම නිසා ස්වභාවික බලශක්ති වෙනුවට කෘතිම බලශක්ති භාවිතයට යොමු වීමත් සමග මෙම අර්බුදයට මූලික පදනම වැටුණි. එසේ ම කාර්මික වෙනස්වීම් එතෙකින් නොනැවතී දැව උපකරණ වෙනුවට යකඩ හා වානේ වලින් තැනූ යන්ත්‍ර විශාල වශයෙන් යොදාගන්නා ලදී. මෙසේ නව පෙරළියන් සමඟ වෙළඳපොළ පුළුල්වීමත් නිසා කර්මාන්ත ශාලා ක්‍රමය ඇති විය. (ඊරියගම, 2007, 14 පිටුව)

මහා පරිමාණ කර්මාන්තශාලා බිහිවීම

වාහන මගින් පිටවන අධික දුම්

මේ සමග ම ප්‍රවාහන ක්ෂේත්‍රයේ ද වෙනස්කම් ඇති විය. නාවුක ගමනාගමනය, දුම්රිය ප්‍රවාහනය වාෂ්ප බලය යොදාගෙන ඒවා දියුණුවට පත්විය. ස්වභාව ධර්මයට යටත්ව ජීවත් වූ මිනිසා ස්වභාව ධර්මය පාලනය කිරීමට යොමු වීමත් සමග සීමා සහිත සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනුණි. ගෘහස්ත නිෂ්පාදන ක්‍රමය වෙනුවට කර්මාන්ත ශාලා ක්‍රමය ඇති විය. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නිෂ්පාදන අභිබවා කර්මාන්ත ප්‍රබල විය. කාර්මීකරණය හේතුවෙන් විශාල වශයෙන් නගර කරා ඇදී ඒම ද වළක්වා ලිය නොහැක්කකි. යුරෝපා රටවල කාර්මික විප්ලවය ඇතිවීමත් සමග වෙනස්වීමේ ප්‍රතිඵලයක් ලෙස සමාජ වැඩ බිහිවිය. ඉතිහාසයේ සමාජ වෙනස්වීමක් පුළුල් ලෙස සිදු නොවුනි. මෙම වෙනස්වීම යුරෝපා රටවල පමණක් නොව, තුන්වන ලෝකයේ ජාතීන් අතර ද දැනට සිදුවෙමින් පවතී. සමාජ හා භෞතික පරිසරය තුළ කර්මාන්තශාලා පිහිටුවීම සහ තාක්ෂණික වෙනස්කම්වලට මුහුණදුන් අතර මෙයින් ග්‍රාමීය ප්‍රදේශ අතහැර නගර කරා විත් කර්මාන්තශාලාවල කම්කරුවන් ලෙස දුෂ්කර තත්ත්වයන් යටතේ වැඩ කළේය. මේ හේතුව නිසා සමාජ ප්‍රශ්න උග්‍ර විය.(Roberstson,1977,P11) කර්මාන්ත ශාලා ප්‍රධාන වශයෙන් ගත් විට ඒවායෙහි මූලික ව්‍යුහය සැකැස්ම ම පරිසරයට හිතකර නොවේ. ඒවායෙන් පිටවන විෂදුම, විෂ වායූන් පරිසරයට මුදාහල කල මිනිසුන් තුළ විවිධ ලෙඩරෝග ඇතිවේ. මේ නිසා මානව සම්පත් පමණක් නොව ස්වභාවික සම්පත් ද විශාල ලෙස තර්ජනයකට ලක්වී පවතින බව පෙන්වා දිය හැකිය. කාර්මීකරණයට භාජනය වූ නූතන සමාජවල මෙම තත්ත්වය වඩාත් උග්‍රවන අතර කාර්මීකරණයට භාජනය නොවූ පැරණි සමාජවල පාරිසරික බලපෑම් අවම තත්ත්වයක් දැකගත හැකිය.

මෙසේ කාර්මික විප්ලවය හා එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ නාගරීකරණය යන සංකීර්ණ ක්‍රියාවලීන්හි සිදුවූ සමාජ ආර්ථික අර්බුදකාරී වාතාවරණයන් හා අනිකුත් සාධක දැඩි අවධානයකට යොමු කරමින් සමාජය අවබෝධ කර ගැනීමේ කාර්යයෙහි ප්‍රංශ ජාතික සමාජ විද්‍යාඥයෙකු වන Auguste Comte නිරත වීම නිසා ඔහුට 1798 දී සමාජ විද්‍යාව නම් විෂය බිහිකළ හැකි විය. මෙසේ සමාජ විද්‍යාව නම් විෂය තුළින් මෙම අර්බුදකාරී වාතාවරණය හඳුනා ගැනීමට බොහෝ සමාජ විද්‍යාඥයන් උත්සාහ දැරීය. ඔවුන් හැම විටම පැවති හා පවතින සමාජ තත්ත්වයන් දෙකක් සංසන්දනය කරමින් නවීන සමාජවල පවතින ක්‍රියාවලිය හඳුනා ගැනීමට උත්සාහ දැරීය.

එමිල් ඩුර්කයිම් (Emile Durkheim) නම් සමාජ විද්‍යාඥයා විසින් අධ්‍යයනය කළ යාන්ත්‍රීය ඒකාබද්ධතාවයෙන් යුතු සමාජයත් ඓන්ද්‍රිය ඒකාබද්ධතාවයෙන් යුතු සාමජයත් ගත් විට යාන්ත්‍රික ඒකාබද්ධතාවය නොදියුණු සරල සමාජවල ක්‍රියාත්මක වී තිබුණි. එසේ ම ඓන්ද්‍රිය ඒකාබද්ධතාවය සංකීර්ණ සබඳතා ඇති නූතන සමාජ වල ක්‍රියාත්මක වේ. ඩුර්කයිම් දැක් වූ පරිදි ශ්‍රම විභජනය හේතුවෙන් විවිධ සමාජවල සංවර්ධනය යාන්ත්‍රික ඒකාබද්ධතා පදනමේ සිට ඓන්ද්‍රීක ඒකාබද්ධතාවය දක්වා සංචලනය වී ඇත. (Durkheim,1934,P xix) ඩුර්කයිම් The Division of Labour in Society නැමැති කෘතිය තුළින් සමාජයේ පවත්නා ප්‍රශ්නවල ස්වභාවය සහ ව්‍යුහය පිළිබඳව න්‍යායාත්මක දෘෂ්ටිකෝණයකින් අදහස් දක්වා ඇත. යාන්ත්‍රික ඒකාබද්ධතාවයක් පැවති සමාජවල සෑම කෙනෙකුම තමන්ට අවශ්‍ය අවශ්‍යතා සපුරාගැනීමෙහි නිරත වූ නිසා ශ්‍රම විභජනය අවම මට්ටමක පැවතිණි. මෙවැනි සමාජ කාර්මීකරණයට හසු වූ සමාජ නොවීය. එබැවින් පරිසර හානිය අවම තත්ත්වයක් මෙම ඩුර්කයිම් අධ්‍යයනය කළ යාන්ත්‍රීය ඒකාබද්ධතාවයෙන් යුතු සමාජවල දැකගත හැකිවිය. නමුත් ඓන්ද්‍රිය ඒකාබද්ධතාවයෙන් යුතු සමාජ කාර්මීකරණයට හසු වූ නූතන සමාජයි. මෙම සමාජවල විශාල වශයෙන් කර්මාන්ත ආශ්‍රිතව පාරිසරක ගැටළු රාශියක් හටගෙන ඇති බව පෙන්වා දිය හැකිය.

එසේ ම ෆර්ඩිනන්ඩ් ටෝනීස් (Ferdinand Tonnies) අධ්‍යයනය කළ Gemeinschaft (ප්‍රජාව) හා Gessellschaft (සමාජය) යන පරමාදර්ශී සමාජ ආශ්‍රයෙන් සමාජ වෙනස්වීම පිළිබඳව කරුණු ඉදිරිපත් කළේය. ගෙමයින්ශාෆ්ට් තත්ත්වයේ සිට ගෙසල්ශාෆ්ට් තත්ත්වය දක්වා සමාජ වෙනස්වීමේ ක්‍රියාවලිය ක්ෂණිකව සිදුවූවක් නොවන අතර ඒ සඳහා මහා පරිමාණ කර්මාන්ත ශාලා බිහිවීම වාණිජත්වයේ නැගීම හා නාගරීකරණය යන සාධක ප්‍රධාන වශයෙන් බලපාන ලදී. සංකීර්ණ තාක්ෂණයන්, විශාල යන්ත්‍රෝපකරණ නොමැති ගෙමයින්ශාෆ්ට් සමාජය තුළ ද සිදුවූ පරිසර හානිය අවම තත්ත්වයක් බව මේ අනුව පෙන්වාදිය හැකිය.



නාගරීකරණය

රොබට් රෙඩ්ෆීල්ඩ් (Robert Redfield) විසින් ගොඩ නැගූ ගැමි සමාජ හා නාගරික සමාජ යන සමාජ ක්‍රම දෙකෙන් ගැමි සමාජය තුළ මෙම සංකීර්ණ ගති ලක්ෂණ දක්නට නොමැත. කුඩා පරිමාණ ලිවීමේ හා කියවීමේ හැකියාව නොමැති සමූහ ඒකාබද්ධතාව පිළිබඳ ප්‍රබල හැඟීමක් ඇති ව්‍යවස්ථා හෝ තාර්කික නීති විරල වශයෙන් දක්නට ඇති මෙම ගැමි සාමජය තුළ වෙළඳපොළ ක්‍රියාත්මක වීමක් ද දක්නට නැත. (පෙරේරා, 2005, 144 පිටුව) මේ නිසා මහා පරිමාණ පරිසර හානියක් දක්නට නොලැබේ. එසේ නම් මෙම මහාපරිමාණ පරිසර හානියක් දක්නට ලැබෙන්නේ කුමන සමාජවල ද? සැබවින් ම කාර්මීකරණයට ලක්වූ ඓන්ද්‍රීය ඒකාබද්ධතාවයෙන් යුතු නවීන සමාජ වල ප්‍රබල වශයෙන් මෙම තත්ත්වය දක්නට ලැබෙන බව කිව යුතුය.

විශාල වශයෙන් කාර්මාන්ත ශාලා ව්‍යාප්ත වුණු නාගරික සමාජ තුළ ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වීම තුළින් කර්මාන්ත ශාලා වලින් පිට කරනු ලබන අප ද්‍රව්‍ය බැහැර කරනු ලබන්නේ ගංගා ඇල දොල වලටය. එපමණක් නොව, ඒවායින් පිටවන විෂ වායූන් වාතයට මුදා හැරීම හේතුවෙන් වායු දූෂණය ද ප්‍රබල ලෙස සිදුවන බව කිව යුතුය. කර්මාන්ත ක්ෂේත්‍රයන්හි රැකියාවන් උදෙසා ගමෙන් නගරයට සංක්‍රමණය කළ ජනතාවට මේ නිසා විවිධ රෝගී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවේ. 1977 න් පසුව ඇති වූ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය නිසා ග්‍රාමීය ප්‍රදේශවල බොහෝ දෙනෙක් රැකියා සොයා නගරයට ඇදෙන්නට විය.

කාර්මික ව්‍යවසායයන්ගේ ප්‍රාදේශීය ව්‍යාප්තිය. ශ්‍රී ලංකාව (2000)

දිස්ත්‍රික්කය	කාර්මික ව්‍යවසාය සංඛ්‍යාව	ප්‍රතිශතය	දිස්ත්‍රික්කය	කාර්මික ව්‍යවසාය සංඛ්‍යාව	ප්‍රතිශතය
කොළඹ	2023	55.8	බදුල්ල	30	0.8
ගම්පහ	716	19.7	කෑගල්ල	26	0.7
කළුතර	163	4.7	මාතලේ	21	0.6
ගාල්ල	91	2.5	මොණරාගල	13	0.4
පුත්තලම	127	3.5	පොළොන්නරුව	11	0.3
නුවර	104	2.9	අම්පාර	12	0.4
කුරුණෑගල	73	2.0	ත්‍රිකුණාමලය	5	0.1
මාතර	48	1.3	මඩකලපුව	4	0.1
හම්බන්තොට	41	1.1	වව්නියාව	2	0.05
නුවරඑළිය	45	1.2	යාපනය	4	0.1
රත්නපුර	38	1.0	මන්නාරම	-	-
අනුරාධපුර	28	0.8			

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2001

කොළඹ නගරය ආශ්‍රිතව ප්‍රධාන වශයෙන් ම කර්මාන්ත ව්‍යාප්ත වීම නිසා පරිසර හානිය මහා පරිමාණයෙන් දැකිය හැකිය. "චාල්ස් සී කෝල්ටන් පවසන පරිදි පරිසර ගැටලුව යනු හිම බෝලයක් වැනි දෙයකි. එය පෙරලෙන්නට ගත් විට වේගයෙන් පෙරලේ". පරිසර ගැටලු පිළිබඳ අධ්‍යයනයේ දී ප්‍රධාන වශයෙන්ම වනාන්තර දූෂණය වීම පිළිබඳ පාරිසරික ගැටළු, ජලය දූෂණය වීම, වායු දූෂණය වීම, ශබ්ද දූෂණය වීම, සමුද්‍ර දූෂණය වීම, මිහිතලය දූෂණය වීම, රසායනික ද්‍රව්‍ය භාවිතය නිසා සිදුවන දූෂණය, කැළි කසළ සම්බන්ධව පවතින පාරිසරික ගැටළු ප්‍රධාන වශයෙන් ම කර්මාන්ත ශාලා ආශ්‍රිතව පැණ නගින පාරිසරික ගැටළු ලෙස හඳුනාගත හැකිය.

කර්මාන්තශාලා වලින් පිට කරන විවිධ අපද්‍රව්‍ය ජලයට එක්වීම හේතුවෙන් මත්ස්‍ය සම්පත් විනාශ වීම, ජලය අපවිත්‍ර වීම, දුගඳ ඇතිවීම, පෙට්‍රෝලියම් එකතුවීම, රසායනික ද්‍රව්‍ය එකතුවීම, ජලජ ජීවීන් විනාශවී යාම ආදිය නිසා සාගර ජලය මෙන්ම ගොඩබිම් ජලය ද දූෂණය වේ. මෙසේ ජලය දූෂණය වනුයේ කර්මාන්තශාලා වලින් නාගරික ස්ථාන වලින් හා ගංගා ඇලදොල වලට අපද්‍රව්‍ය බැහැර කරනු ලැබීම නිසාය. කෘෂිකාර්මික බිම්වලට යොදන පලිබෝධ නාශක ද්‍රව්‍ය හේතුවෙන් ද ජලය දූෂණය වේ. පොලිතින් සහ ප්ලාස්ටික් වැනි අපද්‍රව්‍ය ජලමාර්ග වල හිර වීම නිසා නොයෙකුත් ගැටළු මතු වී තිබේ. (සුධම්ම හිමි, 2001, 14 පිටුව)

ගංගා හා විල් දැඩි ලෙස දූෂණය වීම

ධනවත් සංවර්ධිත රටවල ප්‍රධාන වායු දූෂක මූලාශ්‍ර ලෙස සැලකිය හැක්කේ රථවාහන, බලාගාර සහ කර්මාන්ත ශාලාය. වායු දූෂණය බහුලව හටගන්නේ ෆොසිල ඉන්ධන දහනය හේතුවෙනි. එමගින් වායුගෝලයට කාබන් මොනොක්සයිඩ්, සල්ෆර් ඩයොක්සයිඩ්, නයිට්‍රජන් ඔක්සයිඩ්, දූෂක අංශූන් හා හයිඩ්‍රොකාබන් නිකුත් වේ. මෙමගින් වායුගෝලයට එකතුවන දූෂක ද්‍රව්‍ය පරිමාණය ප්‍රධාන කාරණා කීපයක් මත රැඳේ. එනම් ඉන්ධන පරිභෝජන පරිමාව, ඉන්ධන වල ගුණාත්මක බව සහ ක්‍රියාන්විතයේ කාර්යක්ෂමතාව ඒ අතරින් ප්‍රධානය. අඩු කාර්යක්ෂමතාවයකින් යුතු දහන ක්‍රියාන්විතයන් මගින් වැඩි දූෂක අංශූන්, කාබන් මොනොක්සයිඩ් සහ හයිඩ්‍රොකාබන් නිකුත් වේ. (ධනපාල, 2006, 61, 62 පිටු)


නාගරික ප්‍රදේශවල ජීවත් වන්නන්හට ලෙඩ රෝග ව්‍යාප්ත වීම

ජලය දූෂණය කෙරෙහි බලපාන කාර්මික දූෂක ද්‍රව්‍ය කර්මාන්ත ශාලාවේ වර්ගය හා එහි නිෂ්පාදනයේ ස්වභාවය අනුව වෙනස් වේ. වායු දූෂණයට ප්‍රධානවම බලපාන තාප නිෂ්පාදන කර්මාන්තය ජලය දූෂණයට ද හේතු වේ. ගල් අඟුරු බලාගාර වලින් නිකුත් වන දූෂක අංශූන් අම්ල වැසි ඇතිවීමේ මූලාශ්‍රයයි. ගංගා හා විල් දැඩි ලෙස දූෂණය වීමට බලපාන තවත් කරුණක් වනුයේ කඩදාසි හා කඩදාසි පල්ප නිෂ්පාදන කර්මාන්ත ශාලා මගින් නිකුත් කරන අධික දූෂක ද්‍රව්‍ය ප්‍රමාණයන්ය. මෙම කර්මාන්ත ශාලා වලින් නිකුත් කරන ඉතාමත්ම විෂ සහිත දූෂකයකු වනුයේ පිළිකා සෑදීමට හේතුවන ඓන්ද්‍රීය සංයෝගයක් වන ඩයොක්සින්ය. (ධනපාල, 2006, 126 පිටුව)

කර්මාන්ත ශාලා වලින් පිටකරනු ලබන අහිතකර විෂ වායූන් නිසා සත්ත්ව සම්පතට විශාල වශයෙන් හානි සිදු වී තිබේ. එසේ ම ඒවායෙන් නිකුත් වන මහා පරිමාණ ශබ්දයන්ගෙන් විශාල වශයෙන් ශබ්ද දූෂණයක් දැක ගත හැකිය. එසේ ම කර්මාන්ත ශාලාවලින් නිපදවනු ලබන පොලිතින් වැනි දිරාපත් නොවන ද්‍රව්‍යයන් හේතුවෙන් පසෙහි සාරවත් බවට තර්ජන එල්ලවී තිබේ. ඒ වගේ ම එවැනි ද්‍රව්‍ය ආහාරයට ගැනීමෙන් සත්ත්ව සම්පතෙහි පැවැත්ම තර්ජනයකට ලක්වී ඇත.

ඇත. එපමණක් නොව කර්මාන්ත ශාලා ආශ්‍රිතව ගොඩ නැගෙන මහා පරිමාණ කසල අපද්‍රව්‍ය හේතුවෙන් මුළු පරිසරයම අවලස්සන වනවා පමණක් නොව හමන දුර්ගන්ධයෙන් නාගරික ප්‍රදේශවල ජීවත් වන මිනිසුන්ගෙන් බහුතරයකට ලෙඩරෝග ව්‍යාප්ත වීම දැකිය හැකිය. විශේෂයෙන් ම ගම්පහ වැනි ප්‍රදේශ වල අපිරිසිදු වාසස්ථාන හේතුවෙන් බෝවන ඩෙංගු මදුරු තර්ජනය මත බොහෝ දෙනෙක් ජීවිතක්ෂයට පත් වීම වැළැක්විය නොහැකිය. මේ ආකාරයට අපි බොහෝ දෙනෙක් කථා බහට ලක් කරනු ලබන කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනයත් සමඟ සිදුවන සංවර්ධනය සැබෑ සංවර්ධනයක් දැයි ආපසු හැරී බැලීම කාලෝචිත යැයි සිතේ.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

1. Durkheim, Emile (1934), The Division of Labour in Society, with an introduction by Lewis Croser. Translated by W.D Halls, London, The Macmillan press Ltd.

2. Giddens, Anthony, 1993 , Sociology, Polity press.

3. Jary David and Julia Jary, 1991, Collins Dictionary of Sociology, Harper Collins publishers.

4 Mair, Lucy, 1965, An Introduction to Social Anthropology, London, Claredon press.

5 Robertson, Ian, 1977, Sociology, New York, Worth Publishers.

6 වීරියගම තිස්ස, 2007. කාර්මික විප්ලවය, මුදුන්ගොඩ, තරංග ප්‍රකාශකයෝ.

7. ජයකොඩි, සරත්. කේ. 2008, ශ්‍රී ලංකාව තිරසර සංවර්ධනය අභියෝග සහ ප්‍රතිචාර, කර්තෘ ප්‍රකාශනයකි.

8. ධනපාල, ඒ.එච්. 2006, පාරිසරික භූගෝල විද්‍යාව පරිසර දූෂණය හා ජෛව විවිධත්වය, නුගේගොඩ සරසවි ප්‍රකාශකයෝ.

8. ධනපාල, ඒ. එච්, 2006, පාරිසරික භූගෝල විද්‍යාව පරිසර දූෂණය හා ජෛව විවිධත්වය, නුගේගොඩ සරසවි ප්‍රකාශකයෝ.

9. පෙරේරා, බී.ඒ.ටෙනිසන්, 2005, මානව විද්‍යා හා සමාජ විද්‍යා ප්‍රවේශය, කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

10. සුධම්ම හිමි, තලගල්ලේ, 2001, පරිසර ගැටළුව සහ පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ආකල්ප, දෙහිවල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ගංගා ආශ්‍රිතව ගොඩගැසෙන අපද්‍රව්‍ය

කර්මාන්තශාලාවලින් පිට කරන විවිධ අපද්‍රව්‍ය ජලයට එක්වීම නිසා මත්ස්‍ය සම්පත විනාශ වීම